# අපූරු දවස්

W.H.G.සංචලා සෙනාරා සඳපියුම් වීරසිංහ

# අපූරු දවස්

**W.H.G.සංචලා සෙනාරා සඳපියුම් වීරසිංහ**

කතෘ

පාසල- මා/බුද්ධඝෝෂ ජාතික පාසල- පලාපත්වල- මාතලේ

ශ්‍රේණිය -10 C

කෘතිය පළකරන දිනය - 2025-02-08

## විදුහල්පතිගේ ප්‍රකාශය

වත්මන් ගෝලීයකරණය වන ලෝකයේ දරු දැරියන් කියවීමෙන් දුරස්ව සිටින ස්වරූපයක් දක්නට ලැබෙන අවස්ථාවක මහනුවර මහාමායා විද්‍යාලය මඟින් පවත්වනු ලබන හෙරණගත්කරණි වැඩසටහන පැසසුමට ලක්කරමි.

දුවාදරුවන්ගේ නැණස වර්ධනයකරන මෙවැනි වැඩසටහන් ඉදිරියටත් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම මා/බුද්ධඝෝෂ ජාතික පාසල නියෝජනය කරමින් වැඩසටහනට සහභාගි වන දරු දැරියන්ට සුභාසිංශන එක් කරමි.

A.J.අතුල සහම්පත්

විදුහල්පති

මා/බුද්ධඝෝෂ ජාතික පාසල

## නියෝජ්‍ය විදුහල්පතිනියගේ ප්‍රකාශය

හෙරණගත්කරණි වැඩසටහන මහතලා පුරවරයන් දිරිපත් වන දුවා දරුවන්ට සුභාශිංෂණය පිරිනමන අතර නූතන සමාජය තුළ සාහිත්‍ය රස වනිදනය කිරීම මිනිස් සමාජය තුළින් ක්‍රමයෙන් ඈත් වෙමින් පවතින කාල සීමාවක මහමායාවේ දියණිවරුන් විසින් සිදු කරන හෙරණගත්කරනේ වැඩසටහන තුළින් අප රටේ ශ්‍රේෂ්ඨ ගත්කරුවන් බිහිවේවායි ප්‍රාර්තනාකරමි.

R.M.S.P.K.රත්නායක

නියෝජ්‍ය විදුහල්පති

# පිදුම

මා මෙලොවට උපන් දා සිටම මා වෙනුවෙන් දිවා රෑ නොබලා මා හැදූ වැඩූ දෙමාපියන්ටත්

මාගේ පවුලේ සහෝදරයන්ටත් වගේම පාසලට සිප්සතර හැදෑරීමට උම්ණි පසු සියලු සිප් ෂතර අපට මැණාවින් ඉගැන්වනු

අප පාසලේ පුස්තකාලාධිපතිතුමිය වන මනෝදර ගුරු මෑණියන්ටත්

අප පාසලේ නියමුවානන් වන අතුල සහම්පත් විදුහල්පතිතුමාටත්

මාගේ සහෝදර යහළුවන්ටත් බොහොම ස්තූතියි !

# පෙරවදන

මෙම පොත තුල ඇතුලත් වන්නේ නියුන්සොයුරින් දෙදෙනෙකු හා ඔවුන්ගේ යහළු යෙහෙලියන්ගේ දඟ වැඩවලින් යුතුව සීත කාලය ගත කරන ආකාරයයි. මෙ පොත ලොකු කුඩා සෑම  අයෙකුටම කියවිය හැකි රසවත් යැයි මා විශ්වාස කරමි. ළමුන් මෙම කතා කියවිය යුතු යැයි මම විශ්වාස කරමි. ඒවා  නිසා පුංචි සිත්තුල නිර්මාණ ශක්තිය වැඩි වේවා යැයි මා ප්‍රාර්ථනා කරමි.

-සංචලා-

# පටුන

1. දුරකථන ඇමතුම
2. අලුත් ළමයා
3. පුංචි හොර වැඩක්
4. ජපන් භාෂා විභාගය
5. විභාගයේ ප්‍රතිඵල
6. රාත්‍රී කෑම මේසය
7. හිම සෙල්ලම
8. මොරිස්ට අනතුරක්
9. ලෙඩ දුක් බලන්න ඇවිත්
10. සති අන්තය අවසානයි
11. නිවුන් ළමයි ආයෙත් ඉස්කෝලේ යයි
12. ඉසබෙලාට පුදුමයක්
13. ඉසබෙලාගේ තෑගි
14. විනෝද ගමන
15. තුන්වන වාරයේ අන්තිම දවස

## 01. දුරකථන ඇමතුම

ඩොරිස් නැගිටින්න මොරිස් අනේ නැගිටින්න පුතේ. ඉස්කෝලේ යන්නේ නැද්ද? උදේට නාද වෙන සීනුවට වඩා සද්දෙන් අම්මාගේ කටහඬ ළමුන්ට ඇසුණි. අනේ අම්මමේ තව පොඩ්ඩ වෙලාවක් දෙන්නකෝ. හරිම නිදිමතයි. ඩොරිස්ගේ කටහඬ ඇසුණි. අනේ මන්දා මේ ළඹයි නම් කියා ෂෙරින් නෝනා කාමරයෙන් පිටතට ගියාය.

පාන්පෙති මත ජෑම් තවරමින් සිටි ෂෙරින් නෝනාට දුරකථනය නාද වන හඬ ඇසුණි. අත පිසදාන ගමන් නෝනා සාලය වෙත ගියේය. අනේ අම්මමේ ඔය සද්දදෙ නවත්තගන්නකෝ මොරිස් නින්දෙන් මෙන් කීවේය. අනේ ළමයො කට වහගන්න යැයි කියූ මොරිස් නෝනා දුරකථනය අතට ගත්තේය.

හෙලෝ කව්ද මේ

ආ මම මේ ඩොරිස්ගෙයි මොරිස්ගෙයි ටීච

ආ

ඔව් ඇයි දන්නවද මම කතා කලේ. ඇයි මේ නිවුන් ළමයි ක්‍රීඩා පුහුණුවට අද උදේම ආවේ නැත්තේ. මේ ළමයි කවමදාවත් ක්‍රීඩා පුහුණුවට එන්නෑනේ.

අනේ ටීචර් Sorry මං මේ දෙන්නව එවන්නම්

ආ හරි එහෙනම් මං තියන්නම්

ආ හරි ටීචර් බුදු සරණයි.

ඩොරිස් මොරිස් මේ දෙන්නම නැගිටින්නයි කිව්වේ ඇයි අද ක්‍රීඩා පුහුණුවට ගියේ නැත්තේ අ අහා මේ මේ අම්මේ කට වහගන්න මොරිස් දැන් දෙන්නම නැගිටලා ගිහිල්ලා සෝදගෙන ඉස්කෝලේ යන්න ලෑස්ති වෙන්න.. නිවුන් ළමුන් දෙදෙනා කම්මැලිකමෙන් යුතුව ඇදෙන් බැස ගත්තේය. ඒ අම්මාගේ බැණුම් වලින් බේරීමේ අදහසින් යුතුව ය. බටර් තැවරූ පාන් පෙති කෑම බොරිස්ගේ අකමැතිම ආහාරයයි. එහෙත් බටර් තැවරූ පාන් පෙති මොරිස්ට දිව්‍ය භෝජ්ව වැනිය. මොරිස් තම පිගාන මතට බටර් තැවරූ පාන් පෙති 2ක් 3ක් දාගත්තේය. පාන් පෙති කන නිවුන් දරුවන්ට මෙරීන් නෝනා කිරි වීදුරු 2ක් ගෙනත් දුන්නේය. නමුත් මොරින් නෝනා තාමත් ඔවුන් සමග තරහින් බව පෙනේ.

අම්මා අපිත් එක්ක තරහද? මොරිස් ගොත ගහමින් ඇසුවාය. අපි ආයේ එහෙම කරන්නේ නෑ අම්මේ. ඒත් අපි ක්‍රීඩා වලට කැමති නෑ ඩොරිස් කීවාය. මං තරහ නෑ. ඒත් ඔයාලා ආය එහෙම කරන්න එපා. අපි ආයෙ එහෙම කරන්නේ නෑ අම්මට නිවුන් ළමයි පොරොන්දු වුණා. නිවුන් ළමයි ෂෙරින් නෝනට වැද ශාන්ත ජෝර්ජ්ස් විද්‍යාලයට යෑමට ළමයි සීතල හිම මැදින් පිටත් වුණා.

## 02. <u>අලුත් ළමයා</u>

නිවුන් ළමයි ඉස්කෝලෙට එන තුරු පැටී ජෑන් ඇනී ඉසබෙලා ක්ලොරී මගබලාගෙන උන්නා. නිවුන් ළමුන් එනවා දැක යෙහෙළියන් සතුටට පත් වුණා. නමුත් නිවුන් ළමුන්ගේ සුදුමැළි වී ඇති මුහුණු යෙහෙළියන්ගේ නෙත ගැටුණා. නිවුන් දරුවන් අද උදෑසනම පැමිණි දුරකථන ඇමතුම ගැන යෙහෙළියන්ට මතකාවර්ජනය කළා.

හපොයි දෙවියනේ කියා ඉසබෙලාට ඉබේම කියැවුණි. ඉතින් අම්මා බැන්නද? ඔව් අම්මා නම් දොස් කිව්වා. අනේ මංදා අපේ ක්‍රීඩා ටීචත් ඔව් ඉතින් මිස් කොහොමත් එහෙමනේ. ඇනී කීවා. ක්ලිං ක්ලින් ක්ලිං සීණුව නාද වුණා. යෙහෙළියන් ඇතුළු නිවුන් සහෝදරියෝ පංතිකාමරය වෙත දිව්වා. පංතියේ වැඩ ආරම්භ වුනා. එකපාරම පංතිකාමරයේ දොර ළඟින් ගැහැණු ළමයෙකු එබී බැලුවා. එම ළමයාට මිස් ක්වීනි පන්තියට කතා කළා. එන්න පංතියට මිස් ක්වීනි කිවුවා. එම ළමයා පංතිය තුළට ආවා.

ඇය තරමක් උස කෙට්ටු සුදු ගැහැණු ළමයෙකි. ඇයගේ දෙකම්බුල් රතු පැහැ ගැන්වී තිබුණි. ඇගේ ඇයගේ කොණ්ඩය එකට ගැටගසා විකාර විදියට කොණ්ඩය සකසා ඇත. ඇයගේ උපැස් යුවල නාසය මතට වැටී ඇත. මහ විතාර රූපී විදියට කොණ්ඩය කැරලි මූණ පුරාවට වැටී ඇත. ඔයාගේ නම මොකක්දෑ මිස් ක්වීනි තරමක් නිවුණු ස්වභාවයකින් ඇසුවා. ලෝරි ඈන් ඇය පැවසුවා. ලෝරි ජෑන් ලඟින් වාඩිවෙන්න. ලොරි ජෑන් ලඟින් වාඩි වුණා. ජෑන් ඇයට සිනාසී විස්තර අහන්න පටන් ගත්තා. කට වහගන්න ළමයි මිස් ක්වීනි බෙරිහන් දුන්නා. ළමයි හැමෝම නිශ්ශබ්ද වුණා. අද මං ඔයාලට උගන්නන්න හදන්නේ ජපන් භාෂාවේ අක්ෂර මාලාව. ළමයි සැවොම මේසය මත ඔළුව තබා ගත්තා.

ළමුන්ට නිදිමත හැදුනා මෙනි. ජෑන් ඉසබෙලා දෙස බලා සිණාසුනි. මේ දෙන්නා විහිළු වළට උපන් හපන් දස්කම් පාන හැබෑම දක්ෂයන් දෙදෙනෙකි. අදත් මේ දෙන්නා හදන්නේ විහිළුවක් කරන්නද යැයි පන්තියේ ළමුන්ට ප්‍රේහෙලිකාවකි. ජෑන්ගේ මේ හිනාව දෙස බලා ඉන්නා_ලුත් ළමයා වන ලෝරි ඈන්ට එය මහත් පුදුමයකි. මොකත ඇයගේ පරණ පාසලේ මෙවන් දේවල් නොවුන හෙයින් වෙන්න ඇති. ඉසබෙලා ද ජෑන්ගේ ඉඟි වලට ඉඟි ලබා දේ. අලුත් ළමයාට එය මහත් ප්‍රේහෙලිකාවකි.

ක්ලින් ක්ලිං ක්ලින් ක්ලිං සීනුව නාද වුණෝය. ළමුන්ගේ සිතට ප්‍රීතියක් දැනුනා මෙණී. නමුත් එය මිස් ක්වීනිට ගැසුනා සේ විය. ඇය තාමත් තමන්ගේ පාඩුවේ ජපන් භාෂාව කියා දේ. ාමය පැටීට ඉවසා ගත නොහැකි විය. මිස් ක්වීනිට කතා කළාය. පන්තියම පැටී දෙස හැරී බැලුවාය. පැටීට ලැජ්ජාවක් දැණුනා සේ විය. මොකද ළමයෝ මට කථා ගළේ. මිස් ක්වීන් පැටීගෙන් ඇහුවා. ආ මේ මිස් ක්වීනි අපේ ජපන් භාෂා කාලච්ඡේදය ඉවරයි. ආ පැටි ඔයා මෙච්චරවෙලා බලන් හිටියේ මගේ ජපන් භාෂා පාඩම ඉවර වෙනකන්ද? ආ කියන්න. අනේ නෑ මිස් ක්වීනි. පැටි අහිංසක ලෙස කිව්වා. දැන්ම යනවා මගේ පංතියෙන් එළියට යනවා පැටී. පැටී කේන්තියෙන් එළියට ගියා.

පංතියම මොහොතකට නිහඬ වුණා. ලෝරි ඈන්ට මේවා නුපුරුදු දේවල් නිසා ඇය කම්පාවට පත් වුණා සේ විය. කෝපයට පත් මිස් ක්විනි කෝපයෙන් පිටත් වී ගියා. ඈ නැවත වතාවක් පන්තියට එබී බලා කිව්වා හැමෝම හෙට ජපන් භාෂා විභාගයකට ලෑස්ති වෙන්න කියලා. මුළු පන්තියම කම්පනයට පත් වුණා.

## 03. පුංචි හොර වැඩක්

පැටී දුක්මුසු මුහුණින් පංතියට ආවා. ඒ ළමුන්ගේ බැණුම් විද දරා සිටීමේ අදහසිණි. නමුත් කිසිම ළමෙක් ඇයට මොකුත් කිව්වේ නැත. ඔයාලා හැමෝටම ගොඩක් Sorry මං එහෙම දෙයක් මිස් ක්වීනිට කීවේ තව දුරටත් ඉගෙන ගන්න බැරි නිසා.

ඔව් අපි ඒක දන්නවා පැටී. ඔයා අපිට Sorry කියන්න ඕනි නෑ. ඔයා කළේ අපි හැමෝම කැමති දෙයක්. හැබැයි මිස් ක්විනි කිව්වා හෙට අපිට ජපන් භාෂා විභාගයක් තියෙනවා කියලා. ඒත් අපි ජපන් භාෂාව උගන්වන වෙලාවේ ඉගෙන ගත්තේ නෑ නේ. නිදා ගන්නවා මිසක්. ක්ලෝරි කීවාය. අපිට මේකට මොකක් හරි කරන්න වෙනවා. ජොනි හරි මට මතක් වුණා.

අපිට ජොනීගෙන් පොඩි උදව්වක් ගන්න පුළුවන්නේ. ඩොරිස් සතුටින් කෑ ගැසුවා. ඒත් ජොනී අපිට උදව් කරයිද? ඒ ගැන නම් මම දන්නේ නෑ. ඒත් අපි ජොනීගෙන් අහල බලමු.

පන්තියේ කොනේම ඩෙස් එකක කිසිම යහළුවෙක් නැතිව වාඩි වී සිටින ජොනී ළගට නිවුන් සොයුරියන් ඇතුළු යෙහෙළියන් ගියා. ජොනී කොහොමද ඉතින් ඉසබෙලා ඇසුවාය. හොදයි ජොනී කිව්වා. අපි කැමති ඔයාව අපේ යහළුවෙක් කරගන්න මොරිස් කිව්වා. ජොනී සිනහවක් පෑවා ඔය ඇත්තමද? ජොනී ඇහුවා. ඔව් ඇත්ත තමයි ජැනී කිව්වා. ඒ වගේම ඔයාට හොදම යාළුවෙකුත් හම්බවෙනවා අපේ පන්තියට අලුතෙන් ආපු ලෝරි ඈන්. ජොනීගේ සිත සතුටින් ඉපිළෙයි. ජොනී ඔයා අපිට පොඩි උදව්වක් කරනවද? හා අනිවාර්යයෙන්ම මොකද්ද? ජොනි ඇහුවා. අපිට හෙට තියෙන ජපන් විභාගය ගැන ඔයා දන්නවනේ? ඔව් මම දන්නවා ජොනී කිව්වා. අපි දන්නැති ඒවට ඔයා අපිට උත්තර කියනවද? මොරිස් ඇහුවා. ඒත් මිස් ක්විනිට අහු උනොත්. න උනැ එහෙම වෙන්නේ නෑ. අපිට උදව් කරන්නකො. හරි මං කරන්නම් ජොනී කිව්වා. නිවුන් සොහොයුරියන් සහා යෙහෙළියන් සියලු දෙනාටම ඉතාමත් සතුටුයි.

ක්ලිං ක්ලිං ක්ලිං සීනුව නාද වී පාසල නිම වූ බව දැනුම් දුන්නා. සියලු දෙනාම පාසල තුළ තම තමාට වෙන්කර දී ඇති කාමර වෙතට ගියා. කාමරයක සිසුවියන් දෙදෙනා බැගින් සිටියි. නිවුන් සොහොයුරියන් දෙදෙනා එක් කාමරයක සිටියි. ඒ වගේම පැටී සහ ඉසබෙලා එක් කාමරයක සිටී. ඒ වගේම ඇනී සහ ක්ලෝරි තවත් කාමරයක සිටී. ජෑනී සිටින්නේ තනිවමයි. ඒ තම යෙහෙලිය වන හනී අසනීපතත්වයෙන් ගෙදර සිටිනා නිසයි එහෙත් හනී තව දවස් දෙක තුනකින් පාසලට පැමිණෙනු ඇතැයි ජෑන් තනිවම සිටිනවා දැකපු ලොරි ඇන්ගෙන් එම කාමරයට පැමිණෙන්න දැයි ඇසුවා.

නමුත් ජැනීගේ යහළුවා වන හනී ගැන ලෝරි ඈන්ට පැවසුවා. ඒත් ලොරී ඈන් ඔයාටත් කාමරයක් තියෙනවා එන්න මාත් එක්ක ජෑන් ලෝරිට ජොනීගේ කාමරය පෙන්නුවා. ලෝරි තම කාමරය වෙත ආදරයෙන් භාර ගත්තා.

## 04. ජපන් භාෂා විභාගය

ඊයේ රැය පුරාවටම ජෝනී නිදි මරාගෙන ජපන් භාෂාව පාඩම් කළ නිසා ඇයට මේසය මත නින්ද යයි.. ඒ කෙසේ වෙතත් ජෝනී ජපන් භාෂා විභාගයට හොදින් මුහුණ දීමට අධිෂ්ඨාන කරගෙන සිටියි. ඒ වගේම නිවුන් සොයුරියන්ට උදව් කිරීමට ද ජෝනී මගබලාගෙන සිටී. පන්තියේ දොර ළගින් එබී බැලූ මිස් ක්විනි අත තිබූ ජපන් භාෂා විභාග ප්‍රශ්ණ පත්‍ර ළමුන්ට පෙනේ. මිස් ක්විනි පන්තියට ආ පසු සියල්ම දෙනා නැගිට මිස් ක්විනිට ආචාර කළා. පසුව කිසිම කථාවක් නැතිව ජපන් භාෂා ප්‍රශ්න පත්‍රය බෙදා දුන්නා. මොරිස් සම ඩොරිස් ජෝනී දෙස බලා සිනාසුනා. යෙහෙලියන් කථා කර ගත් පරිදි ජෝනී එයාලට උදව් කරා. සැවොම ජපන් භාෂා ප්‍රශ්ණ පත්‍රයට පිළිතුරු ලිව්වා. ක්ලිං ක්ලිං ක්ලිං නැවත වතාවක් සීනුව නාද වුනා. සැවොම සෙල්ලම් කිරීමට සිතා ක්‍රීඩා පිටියට යෑමට පිටත් වුණා.

05. විභාගයේ ප්‍රතිඵල

අද නම් සැම දෙනාටම එපා වූ දවසකි. එනම් විභාගයේ ප්‍රතිඵල ලැබෙන දවස අදයි. සෑම දෙනාම කම්පාවට පත් වන මොහොත මෙයයි. කවුරුත් නොසිතූ පරිදි මිස් ක්වීනි දොරෙන් එබී බැලූ විට සියලු දෙනාම තිගැස්සුනි.

Good Morning Madam සියපු දෙනාම තම පුටුවෙන් නැගිට කීවේය. Good Morning ළමායි මිස් ක්වීනි කිව්වාය. හ්ම්ම් දැන් මං දයාලා ජපන් භාෂා ප්‍රශ්ණ පත්‍රයට ගත් ළකුණු කියන්නයි යන්නේ. " ඩොරිස්" ඩොරිස් එක පාරටම ගැස්සුණි. ඩොරිස් ළකුණු 65යි. මොරිස් 68යි. ඒ වගේම ඉසබෙලා 60යි. ක්ලෝරී 72යි. ජෑන් 58යි. පැටී 63යි. ඇනී 60යි. ඒ වගේම ගිය වාරවල් වල වැඩිම ළකුණු ගත්තු ජොනී 78යි. ඒ වහේම ලෝරි 80යි. මේ පාර වැඩිම ළකුණු ලෝරි ඈන් විසිණි. ලෝරි ඈන්ට හරිම සතුටුයි. ජොනීගේ මුහුන සුදුමැලි වී ඇත. කවුරුත් නොසිතූ ලෙෂ ලොරි ඈන් වැඩිම ළකුනු ලබා ගත්තේය. ජොනී කම්පාවට පත් වී ඇති සෙයකි.

## 06. රාත්‍රී කෑම මේසය

ළමුන් සියලු දෙනාම දැඩි බඩගින්නනේ යුතුව කෑම මේසයේ වාඩි වුනා. ජේම්ස් නැන්දා කැම සාදා පිගන් ලට අසුරා මේසය මත තැබුවා. මේසයේ රස රස කෑම වලින් පිරිලා. සැන්ඩ්විජ් එළවලු දමා සාදා තිබූ නූල්ඩස් සමග චිකන් සහ සෝස් බිත්තර දමා සාදා තිබූ පැටිස් ඒ වගේම රෝස කරපු තඩිම තඩි කුකුලෙකුත් හිටියා. අතුරුපසට මීපැණි සමග කිරි ලබා දී තිබුණා.

හැමෝම කතාබහේ යෙදෙමින් මේසය මත තිබූ රස රස කෑම කෑවා. සමහරු දෙතුන්පාරක්ම කෑවා. ඒ උනත් අද මිස් ක්වීනිගේ ප්‍රශ්ණ පත්‍රයට සාර්ථකව මුහුන දීමට ලැබීම මේ යෙහෙලියන්ට කෙතරම් සතුටන්ද. ඒ වගේම ජෝනීට යහළුවෙකුත් හම්බුනා. දැන් නම් දෙන්නා එකටමයි. ඒ යාළුකම කඩන්න කාටවත්ම බෑ.

ඒ වගේම මේ රාත්‍රි කැම මේසය ළමුන්ගේ ප්‍රීතිය තව තවත් වැඩි කරයි. ආගිය තොරතුරු කතා කරයි. හරිම ප්‍රීතිජනකයි. මේ පාසල හිම වලින් පිරී ඇත. ළමුන්ට මෙම සීතල තවත් සතුටක් ගෙන දෙයි. රාත්‍රී කෑම මේසය භුක්ති විදීමෙන් පසුව ළමුන් තම තමන්ගේ කාමර වලට ගොස් නින්දට වැටුනා.

## 07. හිම සෙල්ලම්

ක්ලිං ක්ලිං ක්ලිං ක්ලිං පාසල් සීනුව නාද උනා. නමුත් ළමුන් කාමර වල හොද හැටි නින්දට වැටී ඇත. මේ සීතල හිම නිසා ළමුන්ට නැගිටින්න හිතක් දෙන්නේ නැත. කෙසේ වෙතත් ජේම්ස් නැන්දා රසවත් කෑම සාසා මේසය මත තබා ළමුන් පිබිදීම සදහා කාමර වෙත ගියා.

ඩොරිස් මොරිස් නැගිටින්න ළමයි අද සති අන්ත නිවාඩුව. ජේම්ස් නැන්දා ළමුන් සියලු දෙනාටම මෙසේ පවසා කුස්සිය වෙතට ගියා. ජේම්ස් නැන්දාගේ කටහඩින් ළමුන් අවදි වුණා. යෙහෙළියන් සියලු දෙනාම සීතල මැදින් අවදි වී මුහුන කට සෝදා ගත්තා. ඩොරිස් අපි අද හිම සෙල්ලම් කරමුද? මොරිස් ඇහුවා. ඔව් අපි අනිත් අයගෙමුත් අහල බලමු ඩොරිස් කිවුවා. යෙහෙළියෝ සියලු දෙනාම ජේම්ස් නැන්දාගේ කෑම රස විදීමට කෑම මේසය වෙත ගියා. කෑම මේසයේදි කෑම කමින් සිටි යෙහෙළියන් දෙස මොරිස් බැලුවේය. යාළුවනේ අපි හිම සෙල්ලම් කරමුද මොරිස් ඇසුවා. ඩොරිස් එක එල්ලේම එය අනුමත කළා. මොරිස්ගේ අහිංසන බැල්ම දුටු යෙහෙළියන් මහ හයියෙන් සිනාසුනා. මොරිස් අහිංසක ලෙස සිනහවක් පෑවා.

යෙහෙළියන්ගේ සිනහව තව තවත් වැඩි වුණා. ඕක නවත්තන්න ළමයි. ජේම්ස් නැන්දා කීවා. ළමුන්ගේ සිනහව නතර වුනා. හරිම විනෝදයෙන් යුතුව උදෑස කැව වේල ආහාරයට ගත්තා.

යෙහෙළියන් කෑම කා අවසන් වී පාසලේ පිට්ටනිය වෙත ආවා. යෙහෙළියන් මේ ෂති අන්තයේ කරන්න පුළුවන් සෙල්ලම් ගැන සිතා බැලුවා. ඒ අතරේ ඉසබෙලා කීවා අපි  හිම බබෙක් හදමු කියලා. ජෑන් එයට ඉහළින්ම කැමති වුනා.

හරි එහෙනම් අපි හිම බබා හදමු කියා පැටී කියා ඇනී ගේ මුහුණට හිම ගුලියකින් ගැසුවා. ඒ සතුටට පත් යෙහෙලියන් හිම බෝල වලින් ගසා ගත්තා. මොරිස් සහ ඉසබෙලා එකතු වෙලා හිම බබාගේ බඩ සෑදීමට ලොකුම ලොකු හිම බෝලයක් හැදුවා.

08. මොරිස්ට අනතුරක්

රෑ වෙන්නට ආසන්නව ඇත. මේ යෙහෙළියන් හදපු හිම බබා ළග තාමත් සෙල්ලම් කරමින් හිටියා. සීනුව නාද වීමත් සමගම මේ නිවුන් සහෝදරියෝ ඇතුළු සියළු දෙනාම තම තමාගේ කාමර වෙත යෑමට සූදානම් වුණා.

අඳුර මැකීමට ගිණි මැල ගසා ඇත. හිම බබා සෑදීමට අවශ්‍ය බඩු සෑම තැනම ළමුන් මේ දේවල් අස් කරමින් සිටීයි.

පසුව ළමුන් ගිණි මැල නිවා ඒ අසලින් යෑමට ගියා නමුත් ගිනිමැල නිවූ පසු ඉතා දැඩි අඳුරක් පැවතුණ හෙයින් අසල තිබූ ගහක හැපී මොරිස් බිම වැටුනේය.

මොරිස් ඔයාට කරදරයක් නෑ නේද?

නැහැ කරදරයක් නම් නෑ ඒත් කකුල නම් උස්සන්න ටිකක් අමාරුයි.

අනේ මොකද මේ උනේ.

අපි ජේම්ස් නැන්දව එක්කගෙන එමු ඊට පස්සේ අපි මොරිස්ව අසනීප කාටරේට එක්කන් යමු.

මොරිස් එක්ක අපි ඉන්නම් ඈන් ජේන් ඔයාලා දෙන්නා ජේම්ස් නැන්දව එක්කන් එන්න යන ඉක්මනට.

ජේම්ස් නැන්දා

ජේම්ස් නැන්දා

ඉක්මනින් එන්නකෝ

ජේම්ස් නැන්දා

මොකද ළමයි මේ?

අනේ ජේම්ස් නැන්දේ

පොඩි කරදරයක්

මොරිස් වැටුනා එයාට කකුළ උස්සන්න අමාරුයි

දෙවියනේ

කෝ දැන් මොරිස්

ඉන්නවා ජේම්ස් නැන්දා එන්නකෝ

මේ තුන්දෙනා මොරිස් සිටින තැනට ගියා. මොරිස්ව උස්සා ගත් ජේම්ස් නැන්දා අසනීප කාමරය වෙත ගියා.

මේට්‍රන් වරිය මොරිස්ව පරීක්‍ෂා කර ප්‍රතිකාර ලබා දුන්නා.

ඩොරිස් ඇය ළඟ නතර උනා.

යෙහෙලියන් තම තමන්ගේ නිදන කාමර වෙත ගියා.

## 09. ලෙඩ දුක් බලන්න ඇවිත්

මොර්ස් ඇද මත දිගා වෙලා හිටියා. මොරිස්ට කකුල ටිකක් රිදෙනවා වැනිය. මොරිස්ට අල්ලපු ඇද මත ඩොරිස් නිදා සිටි.

ඩොරිස්ට මහන්සි හෙයින් ඇය තාමත් නිදා සිටියි. මේට්‍රන්වරිය මොරිස් පරීක්ෂා කර බැලීම සඳහා කාමරයට ආවේය.

හලෝ Good Morning මොරිස්

Good Morning මෙට්‍රන්

ඩොරිස් නම් තාම නිදි නේ මහන්සි ඇති. දැන් කොහොමද කකුල

දැන් නම් රිදෙන ගතිය අඩුයි.

ම්ම්ම් මොනවද අද ඔයාට කන්න ඕනි මොරිස්

මොනව හරි කමක්නෑ මේට්‍රන්

හරි මම කන්න මොනවා හරි ගෙනත් දෙන්නම්.

ඩොරිස් නැගිටින්න ළමයෝ කියා මේට්‍රන්වරිය පිටත්වුණා

ඩොරිස් අවදි වී මුහුණ කට සෝදා අලුත් ඇඳුමක් ඇඳගත්තා.

යෙහෙළියෝ මොරිස් බැලීම සඳහා කාමරයට ඇතුළු වුනා.

මේ අසනීප කාමරයට ඇතුළු වන්නට ළමුන් හීනෙකින් වත් හිතන්නේ නැත.

ඒ මේට්‍රන්වරිය ලබා දෙන බෙහෙත් ළමුන්ට වස ලබා දෙනවා වැනිය.

ඒ මොකද ඒ බෙහෙත් හරිම තිත්තයි.

යාළුවෝ සියලු දෙනාම කාමරයට එබී බැලුවා.

ආ මොරිස් කොහෙමද?

දැන් නම් කැක්කුම අඩුයි. ඔයාලට කොහොමද?

අපිට මොනවා වෙන්නද ඉතින් අපි හොදින්

අපි ඔයාට පොඩි තෑග්ගක් ගෙනාවා.

ඒ මොනවද?

බලන්නකෝ ආ

චොක්ලට්

ආ ළමයි මොකද මෙතන. මොරිස්ට වද දෙන්න එපා හරිද? මේට්‍රන්වරිය පැවසුවා.

අනේ නෑ මේට්‍රන් අපි කරදර කරන්නේ නෑ.

අනේ ඔව් මේට්‍රන් එයාලා මට කරදරයක් නෙවෙයි.

හ්ම්ම් හ්ම්ම් එහෙනම් කමක්නෑ. හැබැයි කෑගහන්න එපා හරිද ළමයි.

හරි හොදයි මේට්‍රන් අපි කෑ ගහන්නේ නෑ.

යෙහෙළියන් මොරිස්ගේ ඇද මත ඉදගෙන කතා කරන්න පටන් ගත්තේය.

## 10. සතිඅන්තය අවසානයි

ඔන්න ඉතින් දැන් ෂතිඅන්තය නම් අවසානයි. සෙනසුරාදා දවසම මෙයාලා එකතු වෙලා හිම බබාලා හැදුවා. එදා හවසම මොරිස්ට කරදරයක් වුණා.

ඉරිදා දවස නම් ඉතින් ඔහේ ගෙවී ගියා. අද සඳුදා පාසල පවත්වන දිනයකි. මොරිස්ට නම් හොදයි නේද? එයාගේ කකුලෙ ප්‍රශ්නෙ නිසා පාසල් එන්නේ නෑනේ. අනේ ඔව් මොරිස්ට කොච්චර හොදද? ඇයි මොරිස්ට විතරක්ද ඩොරිස් ඇය ළග තනියට ඉන්න නිසා එයාටත් ඉස්කෝලේ එන්න ඔනි නෑ.

අනේ අසරන අපි ඇනී පැවසුවා. ළමුන් මහ හයියෙන් සිනාසුනා. සුපුරුදු පරිදි සීනුව නාද වුණා. ක්ලිං ක්ලිං ක්ලිං ළමුන් තම බෑගයද රැගෙන පාසලේ තම පංති කාමර වලට ගියා.

Good Morning ළමායි

Good Morning Teacher

මිස් ජීන් සිංහල ව්‍යාකරන පොතද රැගෙන පංති කාමරය වෙත ආවා. පංතිය දෙස තියුණු බැල්මක් එල්ල කළ ඇය

කෝ අපේ නිවුන් කෙල්ලො දෙන්නා ඇනී

Teacher මොරිස් සෙනසුරාදා වැටුනා. එයාට කකුල උස්සන්න අමාරුයි.

ඉතින් ඒ මොරිස්නේ කෝ ඩොරිස්

Teacher මේට්‍රන්වරිය කිවුවා මොරිස්ව බලා ගන්න ඩොරිස්ට එන්න කියලා.

ම්ම්ම් දැන් අපි පාඩම පටන් ගමු.

හරි ළමායි දැන් ඔගොල්ලෝ කියන්න බලන්න සිංහළ අක්ෂර මාළාවේ අකුරු කීයක් තියේද කියලා.

මේ මිස් ජීන් කියන්නේ හරිම හෙමින් වචන ඇදලා කතා කරන කෙනෙක්. ඒ නිසා මිස් ජීන්ගේ සිංහල පාඩමට ප්‍රිය කරන කිසිවෙකු නැත.

## 11. මොරිස්ට හොඳයි

මිස් ජීන්ගේ සිංහල පාඩම අවසන් වූ පසු ළමුන් මොරිස් බැලීමට අසනීප කාමරය වෙතට ගියා.

හලෝ මොරිස් ඩොරිස්

හලො ඔයාලා මෙහෙ

ඔව් විවේක කාලයනේ. දැන් කොහොමද ඔයාට හොඳද?

ඔව් දැන් මට ඇවිදින්නත් පුළුවන්. හෙට ඉඳන් ඉස්කොලෙත් එන්න පුළුවන් වෙයි කියලා මේට්‍රන් කිව්වා.

අනේ කොච්චර හොඳද?

අනේ පව් අපේ අරණ ඩොරිස්. මෙයාටත් අසනීප කාමරයේ ඉන්න උනානේ කියා යාළුවෝ හැමෝම හිනාවුනා. ඩොරිස්ට නම් දැන් එපා වී ඇති බව පෙනේ.

මට ඉතින් මේ අසනීප කාමරේ ඉන්න වුනේ මේ මොරිස්ගේ මෝඩ වැඩ නිසානේ. ඇස් තියෙන්නේ බලන්නනේ. බලලා අඩිය තිබ්බා නම් මෙහෙම වෙන්නේ නෑ නේ.

කියා ඩොරිස් අත් දෙක බැඳගෙන රවා බලා අනිත්පැත්ත හැරුනේය.

අපේ අක්කා කෙහොමත් ඔහොමනේ. මොරිස් කිව්වා.

සියලු දෙනාම මහ හඩින් සිනාසුනේය.

ක්ලීන් ක්ලීන් ක්ලීන් විවේක කාලය අවසන් විය.

බායි ඩොරිස් මොරිස් කියා යාළුවෝ නැවතත් පංතිකාමර වෙත ගියා.

බායි ඔයාලා හැමෝටම. අපි දෙන්නත් හෙට ඉඳලා ආයෙත් ඉස්කෝලෙ එනවා.

## 12. නිවුන් ළමයි ආයෙත් ඉස්කෝලේ යයි

දැන් රෑ බෝ වීගෙන එන්නත් ළඟයි. මේට්‍රන් මොරිස්ව පරීක්ෂා කිරීම සඳහා අසනීප කාමරය වෙත ආවා. ආ මොරිස් දැන් මෙයාට ගොඩක් හොදයි. හෙට ඉදන් ඉස්කෝලේ යන්න පුළුවන් දැන් ඔයාලා දෙන්නා ඔයාලගේ කාමර වලට ගිහින් නිදා ගන්න. හෙට උදේම නැගිටලා ඉස්කෝලෙ යන්න.

ෂහාදයි මේට්‍රන් අපි අපේ කාමර වලට යන්නම්. ඩොරිස් ඉතාමත් ෂතුවෙන පැවසුවේය. එන්න මොරිස් අපි අපේ කාමරේට යමු.

ශ්ම් හ්ම් අපි අපේ කාමරේට යමු. ඔයාට ගොඩක් ස්තූතියි මේට්‍රන් මාව සනීප කරාට.

ඕක මොකක්ද අනේ මේට්‍රන් උජාරුවෙන් මෙන් පැවසුහ. ආ මොරිස් ඔයා තාම සෙල්ලම් කරන්න සුදුසු නෑ. හරිද කකුල හොදටම හොද වෙනකං.

අනේ ඒක කොච්චර දෙයක්ද?

මට ආයේ ක්‍රීඩා පුහුණුවීම් වලට උදේම එන්න ඕනි නෑ නේ. කියා මොරිස් සිතුවේය.

ඩොරිස් තම නැගනිය වන නිවුන් සොයුරිය අල්ලාගෙන කාමරය වෙත සෙමින් ඇවිද ගියේය.

නිවුන් සොයුරියන් දෙදෙනා කාමරයට ගොස් පොත් බෑගය සකසා ඇදට ගොස් නිසා ගත්තේය.

Good Night ඩොරිස්

Good Night මොරිස් මොවුන් දෙදෙනා හොද සැප නින්දේ පසුවෙයි.

ඔරලොසුවේ කටු කැරකී ගොස් එළාම් එක මගින් මෙවැනි ශබ්ධයක් ඇසුණී.

ට්‍රියින් ට්‍රියින්

ට්‍රින් ටින් ට්‍රින්

මොරිස් අවදි උනේය. ඩොරිස් ඩොරිස් නැගිටින්න. අපිට ඉස්කෝලේ යන්න තියෙනවා ඩොරිස්

හරි හරි අනේ මං නැගිටලා ඉන්නේ. එහෙනම් අපි ලෑස්ති වෙලා ඉස්කෝලේ යමු. යෙහෙලියන් නිවුන් ළමයි පංතියට එනකම් මග බලාගෙන සිටියි.

හලෝ යාළුවනේ ඔන්න අපි ආවා නිවුන් ළමයි කිව්වා

ආනේ අපේ දෙන්නා ඇවිල්ලා

13. ඉසබෙලාට පුදුමයක්

ඉසබෙලා එන්නකො අපි පොඩ්ඩක් අපේ කාමරේට ගිහින් එමුද?

ඒ ඇයි

මගේ ගණිත පොත අමතක වෙලානේ

ආ එහෙමද අපි යමු.

ඉසබෙලා සහ ජෑන් කාමරයට පිටත්ව ගියේය.

මේ ඇහුණද ඉසබෙලාගේ Birth Day එක අපි එයාව පුදුම කරන්න ඕනේ ජෑන් ඉස්කෝලෙන් පස්සේ ඉසබෙලාව කොහේ හරි එක්ක යයි. අපි ඩසබෙලාගේ කාමරය ලෑස්ති කරන්න ඕනේ එයාව එක්කගෙන එනකොට අපි ඔක්කොම ලෑස්ති කරලා තියන්න ඕනි. ජෑන් සහ ඉසබෙලා නැවත පංතියට ආවා. ආ කටවහගන්න අර ඉසබෙලා එනවා.

ළමුන් තම තමාගේ අසුන් වල ඉද ගත්තේය. මිස් ක්වීනි ද පංතියට පැමිණ ජපන් භාෂාව කියා දීමට පටන් ගත්තේය. පැය 4ක් පමණ ගෙවී ගියේය.

පාසල නිම විය.

ඉසබෙලා පුදුම කරන වේලාව උදා වී ඇත.

අනේ ඉසබෙලා මාත් එක්ක පොඩි ගමනක් යන්න එන්න පුලුවන්ද ඔයාට ජෑන් ඇසුවා.

ඔව් මට පුළුවන් ඒත් කොහෙද යන්නද?

ඔට අපේ සංගීත මැඩම් හම්බවෙන්න ඕනේ.

හා හා අපි යමු.

යෙහෙලියන් මොවුන් දෙදෙනා යන්නට හැර ඉසබෙලාගේ නිදන කාමරය වෙත ගියා. මං බැලුමබෝල ටික පුම්බන්නම්. ඇනී සහ ක්ලෝරී බැලුම්බෝල ටික පුම්බා එල්ලුවේය. පසුව කාමරය අතුගා පිරිසිදු තර මේසයක් එලා ලස්සන රෙද්දක් දැම්මේය.

ටංටරාන් මං ලස්සන කේක් එකක් හැදුවා මේක හරිම රසයි කියාගෙන ජේම්ස් නැන්දා ආවා. ජේම්ස් නැන්දා කේක් එන මේසය මත තැබුවේය. දැන් ඔක්කොම හරි කියු ජේම්ස් නැන්දා ආඩම්බරයෙන් යුතුව අත පිස දා ගත්තා.

ගුරුවරුන් යෙහෙලියන් සියලු දෙනාම ඉසබෙලාගේ කාමරය වෙත ආවේය. වැඩකටයුතු ඉවර යැයි සිතූ ජෑන් කාමරයට යන්නට සූදානම් වුනා.

ජෑන් ඉසබෙලා සහ සංගීත ගුරුතුමිය වන මිස් ඇන්පේලාද ඉසබෙලාගේ කාමරයට ආවේය.

Happy Birthday Issabela

සැවොම එකවර කීවේය. ඉසබෙලා එන්න ඉසබෙලා කේක් කපන්න විදුහල්පතිනිය කීවා. ඉසබෙලා කේක් එක කැපීමට කාමරය වෙත ආවේය. අනේ ඔගොල්ලෝ හැමෝම මාව පුදුම කරා. ඕක කපන්න.

Happy Birtday to you

Happy Birtday to you

Happy Birtday Issabela

Happy Birtday to you

ෂැවොම එකවර කීවේය. ඉසබෙලා කැපූ කේක් කෑල්ල පළමුව කැවුවේ විදුහල්පතිතුමියටයි.

වීදුහල්පතිතුමිය තමන් අතේ තිබ්බ තෑග්ග ඉසබෙලාට දුන්නේය. ඒ අයුරින් කේක් කැවූ පස් සැවොම ඉසබෙලාට තෑගි දුන්නේය.

ඇත්තටම මම ගොඩක් පුදුම වුනා. ඔයාලා කෝමද මට හොරෙන් මේක ප්ලෑන් කරේ.

මට නම් ගොඩක් ගොඩක් සතුටුයි. මේක තමා මං සමරපු හොඳම Birthday එක. කියු ඉසබෙලාද කේක් කෑල්ලක් කෑවේය.

## 14. ඉසබෙලාගේ තෑගි

ඉසබෙලා තෑගි බලන්න කියු විදුහල්පතිතුමිය මඳ සිනාවක් පෑවේය.

හොදයි මිස් සබ්රිනා ඉසබෙලා පළමුව මිස් සබ්රිනාගේ තෑග්ග විවෘත්ත කළේය. ඇය ඉසබෙලාට ඉතාමක් ලස්සන ගවුම් දෙකකුත් තොප්පියක් සහ ඉතාමත් ලස්සන සපත්තු දෙකක් තෑගි කර තිබුණි. අනේ ගොඩක් ස්තූති මිස් සබ්රිනා.

පසුව ඉසබෙලා ක්වීනිගේ තෑග්ග විවෘත කර බැලුවේය. එහි ජපන් භාෂා ව්‍යාකරන පොතක් සහ සුරංගනාවියන් සිටිනා ලස්සන පැන්සල් පර්ස් එකක් හා පෑන් පැන්සල් අඩිකෝදු මකන වගේ දේවල් එහි තිබුණා. ගොඩක් ස්තූතියි.

සංහල භාෂාව උගන්වන මිස් ජීනි පොත් පහක් හා කවකටු පෙට්ටියක් සමග එැන්සල් පෑන් හම්බවුණි. ස්තූතියි මිස් ජීනි.

ඒ වගේම සංගීත ගුරුතුමිය වන මිස් ඇන්ජලා ඇයට ලස්සන හුරතල් බෝනික්කෙක් හා බටනලාවක් තෑගි කර තිබුණි. ස්තූතියි මිස් ඇන්ජලා.

ඒ වගේම ඩොරිස් ඇයට සුභපැතුම් පතක් හා සෙල්ලම් බල් පැටියෙක් තෑගි කලේය. මොරිස් ලස්සන මල් පෝච්චියක් හා ලේන්සුවක් තෑගි කළේය.

ඒ වගේම ජෑන් ඇයට පාට පෙට්ටියක් හා චිත්‍ර පොතක් තෑගි කර තිබුණි. පැටී අලංකාර මාලයක් හා කොන්ඩබුල් සමග කීටෑගයක් ලබා දී තිබුණි. ඇනී කොන්ඩකටු හා පොත් දෙකක් ලබා දී තිබුණී.

ඒ වගේම ක්ලෝරි ඇයට සුභපැතුම් පතක් හා පොත් තුනයි පැන්සල් තුනයි ලබා දී තිබුණා.

ඒ වගේම ලෝරි ඇන් හා ජොනී එකතු වී දෙදෙනාම එකම තෑග්ගක් ලබා දී තිබුණී. එය තුල ලස්සන සායක් තිබුණි. මේට්‍රන් වරිය ලස්සන ටී ෂර්ට් එකක් හා කලිසමක් තෑගි කර තිබුණි. ජේම්ස් නැන්දා ඇයට ලස්සන සීතලට අඳින කබායක් තෑගි කර තිබුණි.

ඉසබෙලා සැමදෙනාගේම තෑගි බලා අවසන් කලේය. පසුව සියලු දෙනාම ජේම්ස් නැන්දාගේ විශේෂ කෑම වට්ටේරුවේ රස බැලීය.

ආ ජෑන් ඉසබෙලාට වගේම ඔයාටත් පුංචි තෑග්ගක් තියෙනවා මිස් සබ්රිනා කිව්වා. මට මට තෑග්ගක් ඒ මොකක්ද ඔයාම බලන්නකෝ. ඔයාම බලන්නකෝ. කෝ දැන් ඇස් දෙක වහගන්නකෝ. ම්ම්ම් දැන් හරි ඇස් අරින්නකෝ බලන්න. හනී ඔයා ඉයේ මගේ යාළුවා ඇවිල්ලා හුරේ හනී ඇවිල්ලා. ඔව් ජෑන් මං ආවා. කොහොමද හනී මට නම් හොදයි.

අපි හෙට චාරිකාවකුත් යනවා. ඔන්න අපි දෙන්නා යන්නේ එකට හරිද?

15. විනෝද ගමන

පාසලේ අවසන් දවස් කීපයට මේ යෙහෙළියන් එළඹ ඇත. මේ මෙහෙලියන් දැනට නව වන ශ්‍රේණියේ අවසන් දවස් ටික ගත කරන මේ දවස් වල යෙහෙලියන් විනෝද ගමනක් යෑමටයි සූදානම.

නව වන ශ්‍රේණියේ තුන්වන වසර ගත කරන මේ යෙහෙළියන් මේ වසරේ යන අවසාන විනෝද චාරිකාව මෙයයි. ඔවුන් මෙම චාරිකාව දිල්ලී බලා යාමට කතිකා කර ගත්තේය.

හැමෝම පෝලිමට බස් එකට නගින්න ළමයි. මිස් සබ්රිනා කිව්වා. ළමුන් පෝලිමට බස් එකට ගොඩ වුනා. යෙහෙලියන් දෙන්නා දෙන්නා ඩාගින් ආසන වල වාඩි වුනා. නිවුන් සොහොයුරියන් දෙන්නා එක ආසනයක ද ජෑන් සහ හනී එක ආසනයක දලෝරි ඈන් හා ජොනී එක ආසනයක ද පැටී හා ඉසබෙලා තවත් ආසනයක ද ඇනී සහ ක්ලෝරි එක ආසනයක ද වාඩි වී සිටී.

ගුරුවරියන්ද බසයට නැග අසුන් ගත්තේය. දිල්ලිය බලා යන ගමන ආරම්භ කර බසය පිටත්ව ගියේය.

තයෙහෙලියන් සියලු දෙනා ශාන්ත ජෝන් විද්‍යාලයට දවසකට සමු දී දිල්ලි බලා පිටත්ව ගියේය. යෙහෙලියන් සියලු දෙනා දැන් සිටින්නේ නම් තම තමන්ගේ අසුන් වල නොවේ. සිංදු කිය කිය නටන ගමන් මේ ළමයි තමන් රැගෙන ආපු කෑමත් කන්න පටන් අරන් හමාරයි. මිස් සබ්රිනා ආ මෙන්න කන්න මොරිස් වඩේ මල්ලක් දිගු කළේය.

විස් සබ්රිනා වඩේ දෙකක් අතට ගත්තේය. කාලා බලල කියන්නකෝ මගේ වඩේ රසයිද කියල.

ජේම්ස් නැන්දා කිව්වා. මිස් සබ්රිනා වඩේ කෑල්ලක් කඩා ගත්තේය. ම්ම්ම් හර්ම රසයි. ජේම්ස් ඔයාට නම් හොද අත් ගුණයක් තියෙනවා. මිස් සබ්රිනා කිව්වා. පැය දෙකක් තුනක් ගත වුණු ළමුන් මේ වන විට දිල්ලිට පැමින ඇත.

ළමුන් තමන්ගේ පළමු නැරඹුම් ස්ථානයට පැමින බැස ගත්තේය. වාව් මේ ස්ථානය නම් හරිම ලස්සනයි ක්ලොරිට කියවුණි. අනේ ඔව් හරිම ලස්සනයි. ක්ලොරිගේ යෙහෙලිය වන ඇනී ද කියා සිටියාය.

ඔහෙම තමයි මේ දිල්ලි නගරය මිස් සබ්රිනා කිව්වා.

ගුරුතුමියන්ලා සමග තයෙහෙළියන් සිනළු දෙනා දිල්ලි නගරය ප්රාම ඇවිද්දා. ඩොරිස් දැන් ඉතින් එන්නේ නිවාඩු මාසයබේ අපි ගෙදරත් යනවනේ අම්මා අපිට දීපු ෂල්ලි වලින් අපි එයාලට මොනවා හරි ගමු. මොරිස් ඇහුවා.

ඔව් අපේ පුංචි නංගිගේ Birthday එකත් ළගදී තිබුණානේ. නිවුන් ළමයින්ගේ කථා මැද මිස් ඇන්ජලා ළමයින්ට කථා කළා. ළමයි අපි අයිස් කමුද හරිම රස්නෙයිනේ. මේ මිස් ඇන්ජලා කියන්නේ ළමුන්ට හරිම ආදරේ කරන ගුරුවරියක්. මිස් ඇන්ජලා ළමුන්ට හා අනෙකුත් ගුරුවරියන්ට ජේම්ස් නැන්දට හා මේට්‍රන්ටත් අයිස් අරන් දුන්නේය. ළමුන් හරිම ආසාවෙන් යුතුව අයිස් කෑවා.

ළමුන් තමා කැමති කැමති බඩු මිළදී ගත්තේය. ළමයි අපි දැන් දිල්ලි නගරය බැලුවා ඇති. අපි දැන් අපේපන්සල බලන්න යමු. හැමෝම බසයට නගින්න මිස් සබ්රිනා කිව්වා.

ළමුන් සියලු දෙනා පේලියට බසයට ගොඩ වුනා.

ළමුන් නැවත සිංදු කියන්න පටන් ගත්තා. පැය ½ කට ආසන්න කාලයකින් පන්සලට ඒමට හැකි වුණා. ළමුන් පන්සල වෙත ඇවිත් පන්සල නැරඹුවා. රිළවුන්ද ගස් මත හිදගෙන සිටී. ගැහැණු ළමුන් පන්සලේ ගලක් මත හිදගෙන දිවා ආහාරය ගත්තේය. පසුව ස්වාමීන් වහන්සේටද වැද පන්සලෙන් නික්ම ගියේය. ළමුන්ගේ අවසාන ගමන් වාරය වූයේ නාන්න යෑමයි. යෙහෙළියන් සියලු දෙනාම බසයට නැග නෑම සදහා ගගක් බලා පිටත් වෙමින් සිටී. බසයේ එකම හඩකි. ඒ සිංදු හඩ පමණී. මේ සිංදු කියන්න ළමුන් මිස් ඇන්ජලාවත් එක් කරගෙන ඇත.

ශරි බහින්න ළමයි. ළමුන් අමතර රෙදිද රැගෙන නෑම සදහා ගගට බැස්සේය.

ඍෟ්යි වතුර ගහන්න එපා සීතලයි.

මුළු ප්‍රදේශයම ළමුන්ගේ කටහඬෙන් පිරී ඉතිරී ඇත. ඒ අසල ඇති බසයකින් මිස් සබ්රිනා ළමුන්ට බූන්දි රැගෙන දුන්නේය.

ළමුන් නැවත බසයට නැග ශාන්ත ජෝන් පාසල වෙත පිටත් වූයේය.

16. තුන්වන වාරයේ අන්තිම දවස

නැගෙනහිරින් පායාගෙන එන හිරු එළිය හිම තට්ටු මැදින් ශාන්ත ජෝර්ජ්ස් විද්‍යාලය දෙසට වැටුණේය.

අද සිකුරාදා දිනයක් වුවත් අද දින ඉගැන්වීම් කටයුතු වල නිරත වන්නේ නැත.

විශේෂ නිවේදනයයි!

අද දින ඉගැන්වීම් කටයුතු වල නිරත නොවන අතර ඔබගේ පංති කාමර හා ඒ අවට දනිදන කාමර ද පිරිසිදු කරන ලෙස දන්වා සිටිමි.

අපේ පංතිය භාරය ගුරුතුමිය වන මිස් ක්විනී අපගේ පංතිය වෙත ආවේය.

ළමයි ඉක්මනින් පිරිසිදු කරන්න. තව කොච්චරනන් දේවල් කරන්න තියෙනවද?

ජොනී සහ ලොරී එක්ව පංතිය අතු ගා පිරිසිදු කළේය. මොරිස් එයට උදව් කළ අතර

හනී ඉසබෙලා හා පැටී එක්ව මිදුල අතුගා දැම්මේය.

ජෑන් ඇනී ඩොරිස් හා එක්ව වල් උදළු ගා දැමූ අතර ක්ලෝරී මල්පැල සිටුවීය. මොරිස් ඇයට පොඩි පොඩි උදව් කළේය.

ජේම්ස් නැන්දා ඔවුන්ට තේ හ ාමාළු බනිස් ගෙනැවිත් දුන්නේය.

පංති කාමර පිරිසිදු කල ඔවුන් තම නිදන කාමර පිරිසිදු කිරීමට ගියේය.

පසුව තම තමාගේ නිදන කාමර පිරිසිදු කර හමාර කළ ඔවුන් දිවා ආහාර වේලට කෑම මේසය වෙතට ගියේය.

ශා අද නම් ජේම්ස් නැන්දා හදලා තියෙන්නේ මරු කෑමනේ. කියු ඔවුන් ආහාර ගෙන තම තමාගේ ගමන් මළු අසුරා ගැනීම පිණිස කාමර වෙත ගියේය.

ඔවුන් ගමන් මළු අසුරා ජේම්ස් නැන්දා කුස්සිය පිරිසිදු කිරීමටත් මේට්‍රන් වරියට අසනීප කාමරය පිරිසිදු කිරීමටත් උදව්වට ගියේය.

දැන් සවස 5.30 පමණ වී ඇත. ළමුන්ගේ සිත් වල දැඩි දුකක් දැනී ඇති සෙයකි.

යෙහෙළියන් සියලු දෙනාම හිත හදා ගත්තේ තව සති දෙක තුනකින් නැවත හමු වන නිසයි.

හෙට උදෑසනම ළමුන්ට ගමන පිටත් වීමට ඇති නිසා කළින් රාත්‍රී ආහාර වේල ගන්නට සිදුවිය. යෙහෙළියන් රාත්‍රී කෑම වේල වේලාසන කා අවසන් වී නිදා ගත්තේය.

විදුහල්පතිතුමිය ඇතුළු අනෙකුත් කාර්යමණ්ඩලය ද කෑම කා අවසන් වීමෙන් පසුව නිදා ගත්තේ හෙට දින ඔවුන්ද තම නිවෙස් බලා යන නිසා විය යුතුයි.

ටක් ටක් ටක් කෙමෙන් වේලාව ගත වුණි. උදෑසන විය යෙහෙළියන් සියලු දෙනාම නැගිට මුහුන කට සෝදා පාට ඇදුමකින් සැරසී ගුරුවරියන්ට හා මිස් සබ්රිනාට ද මේට්‍රන්වරියටද ජේම්ස් නැන්දාටද වැද බස්රථයට ගොඩ වුනේ තම නිවෙස් බලා යෑමටයි. ශාන්ත ජෝර්ජස් පාසල දමා යාමට සිදු වීම ළමුන්ගේ නෙතට කදුලු නැග ඔන මොහොතකි. බසය ගමන බලා ඉදිරියට ඇදුණි. ගැහැණු ළමුන් ශාන්ත ජෝර්ජස් පාසල නොපෙනී යන තුරුම තම පාසලට අත වැනුවේ කදුලු පිස දමමිනුයි.

නිමි

# පසුවදන

